# හද විදවන මතක සුවඳ



11

පක්ෂ කාර්යාලයේ සිට ගමට ගිය වෙලාවක ඉඩම් අයිතියක් ගැන වූ කතා බහකදී ඩැනී සහෝදරයාගේ බඩට අලවංගුවකින් (ගල් ඉන්නකින්) ඇන මරාදමා ඇත්තේ ඔහුගේම පවුලේ ඥාතීන් මිස පිට මිනිසුන් නොවේ.

"මේ මනුස්සයා අරක්කු විකුණන කාලේ ඔය නෑයෝ හොඳට ලාභ ප්‍රයෝජන ගත්තා. නෑයෝ කැමති උනේ ඩැනී හිටපු විදියට ඉන්නවා මිසක් මේ වගේ හොඳ මනුස්සයෙක් වෙන එකට නෙවෙයි."

ඩැනී සහෝදරයාගේ මළගමදා එසේ පවසන ලද්දේ ඔහුගේ ගමේ කෙනෙකි. ඩැනී සහෝදරයාගේ මළගමේ සියලු කටයුතු කෙරුණේ පක්ෂයේ මූලිකත්වයෙනි. තල්පාවිල, කැකනදුර, කුඹල්ගම මළගමට රැස්නොවූ තරමේ මහා විශාල සෙනගකගේ අවසන් ගෞරව මැද්දේ ඩැනී සහෝදරයා අවසන් ගමන් ගියේ පක්සයේ සොයුර සොයුරියන්ගේ දෑස් කඳුලින් දෝවනය කරමිනි.

'මැනේජර් සහෝදරයා' එම අන්වර්ථ නම ලද්දේ විවිධ සේවා සමුපකාර වෙළඳ සැලක මැනේජර්කම කිරීම නිසා ය. පක්ෂයේ යාවජීව හිතවතෙකු බවට පත් වී ටික කලකින් සමුපකාර රැකියාවෙන් ඉවත් වූ ඔහු තමාගේම වූ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය.

"අන්න මැනේජර් සහෝදරයා වැටිලා" ගෙවල් හැටේ බර්ටි සහෝදරයාගෙ කඩ කාමරයක පවත්වාගෙන ගිය පක්ෂ කාර්යාලයට පැමිණි සහෝදරයෙකු එසේ පැවසුවේ කථා බහක යෙදී සිටි අතරතුරකදීය. ඔහු එසේ පවසන ලද්දේ බයිසිකලයකින් ඇද වැටීම, ලිස්සා වැටීම වැනි දෙයක් නොවේ. මානසිකව වැටීමක් ගැනය.

පක්ෂයේ ක්‍රියාකාරී සොයුරන් තමන් විසින් කොක්කක් ගසා අමාරුවෙන් ගොඩ නගාගත් හිතවතුන් පක්ෂයෙන් ගිලිහී යා නොදී රැකගන්නේ මහානර්ඝ වස්තු ලෙසිනි. එය මානසිකව වැටෙන කෙනෙකු නගා සිටුවීමට අවශ්‍ය පියවර ගත්තේ නොපමාව ය.

"අනේ නිකම් ඉන්න මහත්තයෝ. කෙළින් ඉන්න මිනිහෙක් එපැයි වැටෙන්න."

නෙත්ති කුමාර සහෝදරයා එසේ කීවේ සිනාසෙමිනි. නිතර මානසිකව කඩා හැලෙන නැවත මහා උනන්දුවකින් ක්‍රියාත්මක වන මැනේජර් සහෝදරයාගේ චරිත ස්වභාවය ගැන අවබෝධයක් තිබූ නිසාදෝ 'නෙත්ති' එය ගණනකට නොගත්තේ ය. මේ අයුරින් හිත දුර්වල කරගත් විට මැනේජර් මා හමුවීමට එයි.

"මට නම් දැන් මේ වැඩේ එපාවෙලා සහෝදරයා. පනයනකම් කථා කරලා අද හිතවත් කරගන්නා එකා හෙට බලනකොට වෙනස් වෙලා. මේ තරම් මිනිස්සුන්ට බැගෑපත් වෙන්න පුළුවන්ද ? මේ තරම් පස්සෙන් යන්න පුළුවන්ද ? මොකෝ මේක අපේ විතරක් වැඩක් යැ ? උන්ට සමාජවාදේ එපා නම් අපිත් දමලා ගහල නිකම් ඉන්න එකයි තියෙන්නේ." ඔහු පවසාගෙන යන්නේ ආවේගයෙනි.

"එහෙම තමයි සහෝදරයා, මිනිස්සු යූ.ඇන්.පී. ශ්‍රී ලංකා පක්ෂවලට යන්නේ මොනවා හරි බලාපොරොත්තුවෙන්.

> *"මට නම් දැන් මේ වැඩේ එපාවෙලා සහෝදරයා. පනයනකම් කථා කරලා අද හිතවත් කරගන්නා එකා හෙට බලනකොට වෙනස් වෙලා. මේ තරම් මිනිස්සුන්ට බැගෑපත් වෙන්න පුළුවන්ද ? මේ තරම් පස්සෙන් යන්න පුළුවන්ද ? මොකෝ මේක අපේ විතරක් වැඩක් යැ ? උන්ට සමාජවාදේ එපා නම් අපිත් දමලා ගහල නිකම් ඉන්න එකයි තියෙන්නේ." ඔහු පවසාගෙන යන්නේ ආවේගයෙනි.*

රස්සාවක්, මාරුවීමක්, උසස්වීමක්, ඉඩමක්, රෙදි කෝටා එකක් ඔය මොනවා හරි ඉක්මනට ලබාගන්න පුළුවන් දෙයක් බලාපොරොත්තුවෙන්. මේ අපිත් එක්ක එන්නේ රටේ ජනතාවට ලැබිය යුතු දේවල් ලබාදෙන්න කැපවෙන මිනිස්සු මිසක් තමන්ට ලබාගන්න මිනිස්සු නෙවී. ඒ නිසා අපිත් එක්ක නවතින්නේ හිතහොඳ පරිත්‍යාගශීලී කොටස. එන හැමෝම ඉන්නෙ නෑ. ඕවා ගණන් ගන්න එපා."

ඉන්පසුව මැනේජර් සහෝදරයා කථා කරන්නේ ඔහු ජීවත්වන ප්‍රදේශයේ ගෙන්ගෙට ගොස් ජනතාවට කරුණු කියා දිනා ගැනීමේ කැන්වසින් ව්‍යාපාරය සාර්ථක කර ගන්නා හැටිය. කඩේවත්ත ප්‍රදේශයේ කැන්වසින් ව්‍යාපාරය කෙරුණේ ඔහුගේ මූලිකත්වයෙනි. පුරා දින තුනක් තිස්සේ කැන්වසින් කණ්ඩායම පිටත්ව ගියේ මැනේජර් සහෝදරයාගේ නිවසේ සිටය. එම කණ්ඩායම්වලට දිවා ආහාරය සපයන ලද්දේ ද ඔහු විසිනි.

මවිසින් කරන ලද නියමුවා පත්‍රයට වාර්තා සැපයීමේ කාර්යය මැනේජර් සහෝදරයාට භාරදෙන ලද්දේ මට වැඩකටයුතු අධික කම නිසාය. ලිවීමේ දක්ෂතාවය තිබූ ඔහු එම කාරිය කරන ලද්දේ මහත් ප්‍රීතියකින් හා විශාල උනන්දුවකිනි. ඔහුට අත්දැකීම් තිබූ ක්ෂෙත්‍රය වූ සමූපාකරයේ දූෂණ හෙළිදරව් කරන වාර්තා කිහිපයක්ම ලිවීමෙන් මහත් කලබගෑනියක් ඇතිකරගත් ඔහුට මැර තර්ජන පවා එල්ල විය. "පාත්තර හූරන සූත්තර පුංචෙක්" නම් වූ වාර්තාව එම කලබගෑනියට හේතුවිය.

1983 ජූලි මාසයේ පැන නැගි ජාතිවාදී කලබල මුවාවෙන් ජේ.ආර්. රජය විසින් ජ.වි.පෙ. තහනම් පක්ෂයක් බවට පත්කළ පසු සංවිධාන රටාව සහමුලින්ම වෙනස් කළයුතු විය. පක්ෂය තහනමෙන් වසරක් පමණ ගතවනතුරු මට මැනේජර් සහෝදරයා හමු නොවී ය. එයින් පසු මට ඔහු හමුවන්නේ කිහිලිකරු දෙකක වාරුවෙන් ගමන් කරන අබ්බගාතයෙකු වශයෙනි.

"විලුඹේ තුවාලයක් හැදුණා. හොඳ උනේ නෑ. පස්සේ බලන කොට වේගයෙන් පැතිරෙන පිළිකාවක්. දණහිස ළඟින් කකුල කපන්න සිද්ධ උනා. කමක් නෑ සහෝදරයා එක කකුලක් තියෙනවනේ. කකුල් දෙකම නැති මිනිස්සු ඉන්නේ."

හිතේ ධෛර්ය වඩවාගත් මිනිසෙකු වශයෙන් ඔහු සිනහවිය. මගේ හිත මහත් වූ කම්පනයකින් පිරී තිබූ බැවින් මට පිළිතුරු සිනහවක් පෑමට නොහැකි විය.

කකුලක් අහිමි වුවද කිහිලිකරු දෙකේ ආධාරයෙන් ඇවිද්ද ඔහු සිය ව්‍යාපාරය කරගෙන යාමට වෙහෙස විය. එය, ඉවත දමන කඩදාසි හොණ්ඩර ගණනින් එකතු කර පරණ කඩදාසි වශයෙන් කඩදාසි තොග එකතු කිරීම සඳහා පරණ ගැසට් පත්‍ර, දුරකථන නාමාවලි හා වෙනත් පොත්පත් තොග එකතු කිරීමට කච්චේරිවලට, පාසල්වලට, වෙනත් කාර්යාලවලට ද යා යුතු වන්නේ ඔහු තම ඥාති පුත්‍රයෙකුගේ සහාය ද ලබා ගත්තේ ය. ඥාති පුත්‍රයා විසින් පදින බයිසිකලයේ නැගීයාම ඔහුට කරන කරදරයක් සේ සැලකූ මැනේජර් සහෝදරයා කෘතිම කකුලක් ලබා ගත්තේ ය. එම කෘතිම කකුල උපයෝග කරගෙන බයිසිකල් පැදීමට ඉගෙන ගත්තේ ය. එසේ බයිසිකල් පදිමින් තම ව්‍යාපාරය කඩා නොවැටී පවත්වා ගෙන යාමට වෙහෙස ගත්තේ ය.

තවත් වසරක පමණ කාලයක් එසේ ගතව යන්නට ඇත. එවිට අගනුවර සිටි මට දැන ගන්නට ලැබුණේ මේ ධෛර්යවන්ත සහෝදරයාට දෛවය දිගින් දිගටම අකාරුණික වී ඇති බවය. එනම් පිළිකාව කකුලේ ඉහළට ඔඩුදුවා ඇති හේතුවෙන් පළමුව දණහිස ළඟින් කපාදැමූ කකුල ඉකිලිය ළඟින්ම කපා දමා ඇති බවය.

"මැනේජර් සහෝදරයා දැන් ඉන්නේ හුඟාක්ම අසාධ්‍ය තත්වයේ කථාකරන්නත් බෑ." මැනේජර් සහෝදරයා පදිංචි කඩේවත්ත ප්‍රදේශයේ බොහෝ දෙනෙකු මා හඳුනයි. ඒ අතර දේශපාලන විරුද්ධවාදියෝ ද සිටිති. තත්වය තරමක් අවදානම් වුවද ඔහු බැලීමට යාමට මම ඉටා ගතිමි.

මමත්, මගේ බිරිඳත් දුටු මැනේජර් සහෝදරයාගේ දෑස ප්‍රීතියෙන් එළිය විය. මුවට අතක් තබා තමාට කතා කළ නොහැකි බව පෙන් වූ ඔහු මගේ බිරිඳට වාඩිවීම සඳහා පුටුවක් පෙන්වී ය. ඔහු ළඟින්ම හිඳගත් මා ඔහුගේ අතක් තරයේ අල්ලා ගතිමි. මගේ සුරත ගෙන ඔහුගේ ළයමත තබාගත් මැනේජර් සහෝදරයා දෙනෙත වසා ගත්තේ ය. ඊළඟ මොහොතේදී ඔහුගේ ඇසිපිය සසල වෙමින් කඳුළු ගලා යන්නට විය. කඳුළු නොසලා සිටීමට මා ගත් තැත අසාර්ථක විය.

කාමරයට පැමිණි මැනේජර් සහෝදරයාගේ බිරිඳ වූ 'මැණිකි' තේරුමක් නැති මොනවදෝ වචන වගයක් පවසා පිටතට ගියා ය.

"දැන් සුමානයක වෙලේ ඉඳලා ඔහොමයි. ඔළුව නරක් වෙලා වගේ" ඔවුන් වැඩිහිටි ඥාතිවරියක විය හැකි තැනැත්තියක් එසේ කිව්වේ ය. අපට තේ සාදා දෙන්නැයි මැනේජර් සහෝදරයා ඇයට දැන්වූයේ හස්ත මුද්‍රාවෙනි. අසාධ්‍යව වැතිර සිටිමිනුත් ඔහුට යුතුකම් මතක් වෙන හැටි.

"සමහරු තමන් ගතකරපු ජීවිතේ දිහා ආපහු හැරිලා බලද්දි තමන්ගෙ රටට, ජනතාවට කරපු කිසිම දෙයක් නෑ. ඒ අතින් සහෝදරයා තමන්ගේ පුද්ගලික ජීවිතේ ගැන විතරක් නොහිතා මේ රටේ දුක්විඳින මිනිස්සුන්ට යහපත් අනාගතයක් හොඳ ලෝකයක් හදලා දෙන්න හුඟාක් දේවල් කළා. පරිත්‍යාග කළා. ඒ ගැන හිතලා සතුට වෙන්න."

මා ඒ ටික කියා ගත්තේ ආයාසයෙනි. ඉන් සතියක් ගතවන්නටත් ප්‍රථම මැනේජර් සහෝදරයා අවුරුදු තිස්පහක් පමණ විය හැකි තම කෙටි ජීවිතයෙන් සමු ගත්තේ ය.

පක්ෂය තහනම්ව නොතිබෙන්නට නිසැකවම ඔහුගේ මළගමේ සියලු කටයුතු සිදු කෙරෙනු ඇත්තේ පක්ෂයේ මැදිහත් වීමෙනි. එහෙත් පැවති තත්ත්වය යටතේ ඔහු අවසන් ගමන යාමට සූදානම් වූයේ බඩ බැඳගත් මිතුරන් මෙන් වූ තමන්ගෙම සහෝදරයන් සේ සැලකූ පක්ෂයේ සොයුරු, සොයුරියන්ගේ අවසන් ගෞරවයත් නොලබාමය.

"ඔහේ යන එක නම් ඒ තරම් සුබ නෑ."

මළගෙදර යා යුතු යැයි මා තීරණය කළවිට සරත් සහෝදරයා පැවසී ය. මා එම තීරණයෙහි දැඩිව සිටින කල ඔහු ද මා සමඟ එහි යාමට සූදානම් විය. "අපි කවුරුවත්ම නොගියොත් පක්ෂයට ලොකු අපවාදයක් එනවා මරණයටවත් ආවෙ නෑ කියල. මම ගියාම ඒක ටිකක් හරි මඟ ඇරේවි."

බයිසිකලයෙන් යන අතරතුරේදී මම සරත්ට පැවසීමි.

මළගෙදර මිනිත්තු දහයක් පමණ රැඳී සිටි අප දෙදෙනා භූමිදානය සඳහා මිනිය ඔසවත්ම කිසිවෙකුගෙන් සමුනොගෙනම පිටත්ව ආවෙමු.

"කවදා හිටියත් මැරෙනවා තමයි. මට දුක මැනේජර් සහෝදරයාගේ දරුවෝ තවම පුංචි උන්."

මා සරත්ට පැවසුවේ මගේ හිත මහා බරකින් පෙළෙමින් තිබියදී ය. දශකවලින් වසර ගෙවා මහා ප්‍රාකාර ගොඩ නගද්දී එම පවුරේ ශක්තියට යොදා ගන්නා ලොකු ගල් සේම කුඩා ගල්ද එකසේ වැදගත් වෙයි. ජ.වි.පෙ. අද මහා ප්‍රාකාරයක් නම් 'නන්දසෙන රත්නසේකර' නම් වූ මැනේජර් සහෝදරයා ද කුඩා ගල් කැටයක් ලෙසින් හෝ එහි ශක්තියට දායක වූ මිනිසෙකි.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට